**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 2023**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ (''කොමිසම'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිසම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිසමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිසම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.1,469,302 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | 2022.01.01 දින වත්කම් වල ඵලදායී ජීවිත කාලය යාවත්කාලින කිරීමට කටයුතු කර ඇති අතර ඔබ විසින් දක්වා ඇති වත්කම් වලට අයත් වත්කම් කාණ්ඩයෙහි සම්පූර්ණ ක්ෂය වූ වත්කම් වල ඵලදායි ජීවිත කාලය යාවත්කාලීන කලහොත් අසාමාන්‍ය ජීවිත කාල වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඔබ සඳහන් කළ පරිදි වත්කම් වල ඵලදායි ජීවිත කාලය වැඩිකළ හොත් වත්කම් වල ක්ෂය වීම් අධි තක්සේරුවක් සිදුවේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ණයගැති ශේෂය තුළ ඇතුලත් වසර 5 කට වැඩි රු.12,632,009 ක් හා වසර 3 ට වැඩි රු.1,740,600 ක් ලෙස එකතුව රු.14,372,609 ක් වූ ණය ශේෂ, ණය කොන්දේසි ප්‍රබල නොවීම, පොදු කොන්දේසි මාලාවක් නොතිබීම හා ඇපකරුවන්ගේ තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ණය අයකර ගැනීම සඳහා ගත් උත්සාහයන්, නීති නිලධාරියෙකුගේ උපදෙස් වලින් තොරව ඉදිරියට ගෙනයාම සිදුකල නොහැකි වූ අතර නව පත්වීම ලද නීති නිලධාරි මඟින් ඉදිරි ක්‍රියා මාර්ග ගනු ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන ගිවිසුම් ගත සේවාවන් සඳහා ඉදිරියට කළ ගෙවීම් ශේෂය | නිරීක්ෂණය පිළිගනිමි . ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | කලින් ගෙවීම් සඳහා සේවාව ලබා ගැනීමට |

| | |
|---|---|
| රු.341,088 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හෝ මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ සිට පැවත එන, මහවැලි ව්‍යාපෘතියට අදාලව එකතුව රු.834,224 ක් වූ ණයහිමි ශේෂය හා පාසල් නව නිපැයුම් කව වෙනුවෙන් ලබා දී තිබූ රු.330,000 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම සඳහා අවස්ථා 02කදී විද්‍යුත් තැපැල ඔස්සේ සහ තවත් එක් අවස්ථාවක ලිපියක් මඟින් ද ලෙස අවස්ථා 03ක දී සිහි කැඳවීම් සිදුකර 2023.03.16 දිනැතිව තවත් ලිපියක් යොමුකර ඇත. ඒ අනුව කොමිසමේ පාර්ශවය වෙතින් ණය හිමි ශේෂයන් නිරවුල් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් ඉදිරි ක්‍රියාමාර්ග ලබාගෙන නොතිබීම හේතුවෙන් ණය හිමි ශේෂයන් නිරවුල් කිරීම සඳහා කොමිසමට හැකියාවක් නොවීය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 756(2) (අ) | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සංයුතිය - මෙම මණ්ඩලය කෙලින්ම ගබඩා භාරව සිටින නිලධාරියා හෝ නිලධාරීන් ද ඔහුට හෝ ඔවුන්ට ආසන්නම යටත් නිලධාරීන් ද හැර වෙනත් වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද කොමිසම විසින් නිලධාරීන් 5 දෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි . නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවල ට අනුව කටයුතු කල යුතු ය. |
| (ආ)ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 1:1 , 3.1 හා 4.1 | රාජකාරි ඉටු කිරීම සඳහා ගමන් බිමන් යෑමට නියම වී ඇති රජයේ නිලධාරියෙකුට ආයතන සංග්‍රහයේ රෙගුලාසි ප්‍රකාරව ගමන් වියදම් ගෙවනු ලබන අතර රාජකාරි ගමන් බිමන් යා යුත්තේ ඒ ඒ අවස්ථාවේ දී පවතින තත්වය අනුව හැකි තරම් ඉක්මනින් යා හැකි ඉතාම කෙටි මාර්ගයෙන් හා ආණ්ඩුවට අඩුම වියදම දැරීමට සිදුවන පරිදි වුවත් ඊට පටහැනිව භාණ්ඩ සමීක්ෂණ සඳහා සහභාගීවන නිලධාරීන්ට කොමිසමේ වාහන පහසුකම් සලසා දී ඉන්ධන හා අනෙකුත් වියදම් වෙනුවෙන් පිළිවෙලින් රු.48,224 ක් හා රු.56,488 ක් වැය කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි . 2024 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවල ට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම් පනතේ 11(1) ඊ ඡේදය | ශ්‍රී ලංකාවේදී පේටන්ට් බලපත්‍ර දෙන ලද නව නිපැයුම් සඳහා නව නිපයුම්කරුවන්ට ධෛර්යය දීම වෙනුවෙන් නව නිපයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන ලබා දිය යුතු වුවත්, 2017 සිට 2023 දක්වා වසර 7 ක කාලයක් සඳහා ජනාධිපති ප්‍රදාන ලබා දී නොතිබුණි. | මේ සඳහා 2023 ජූනි සිට ජනාධිපතිතුමන් වෙතින් දිනයක් ලබාගැනීම සඳහා විමසීම් කලද මේ දක්වා නිශ්චිත දිනයක් ලැබී නොමැත. එය කොමිසමේ පාලනයෙන් බැහැර සංසිද්ධියක් බව ද කාරුණිකව සටහන් කරමි. | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ දිරිගැන්වීම් පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 10,586 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,992,448 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,003,034 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන සඳහා රජයේ දායකත්වය රු.6,377,000 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිසි ශක්‍යතා අධ්‍යනයක් හා සැලැස්මකින් තොරව ලැබෙන අයදුම්පත් හැසිරවීම සඳහා රු.4,600,000 ක මුදලක් වැය කර 2018 වර්ෂයේ දී දත්ත පද්ධතියක් සකසා ඇතත් ස්ථාපිත කල වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති මුළු අයදුම්පත් ගණන 39 වූ අතර සමාලෝචිත වර්ෂය වන විට එවැනි දත්ත පද්ධතියක් ක්‍රියාකාරිත්වයේ නොතිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. මේ වන විට කොමිසමේ නිලධාරින් දත්ත පද්ධතිය පවත්වා ගෙනයාම සිදු කරනු ලබයි. | රජයේ වියදම් දැරීමේදී කාර්යක්ෂමව සහ ඵලදායී වන ලෙස කටයුතු කළ යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනයේ වියදම් වෙනුවෙන් දොම්පේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.500,000 ක මුදල ප්‍රාදේශීය සභාවේ නිල බැංකු ගිණුමට අයත් නොවන සංස්කෘතික හා ආගමික කමිටුව නමින් ගිණුමකට බැර කර තිබුණි. | දොම්පේ ප්‍රාදේශිය සභාවේ ලිපි ශීර්ෂය සහිතව ශාලා ගාස්තු , විදුලිය,ජලය, මේස පුටු සඳහා රු.500,000 ක මුදලක් සඳහන් කර තිබූ අතර අදාල ගිණුම පිළිබඳ මහජන බැංකුවෙන් තහවුරු කර ගැනීමෙන් පසු චෙක්පතක් මාර්ගයෙන් ගෙවීමට කටයුතු කරන ලදී. | රජයේ නිවැරදි ගිණුම්වලට බැර කිරීමට කටයුතු කල යුතු ය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ අරමුදලෙහි ශේෂය රු.12,837,184 ක් හා බීජෞෂණ මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා ලබා දුන් මුදලින් ඉතිරි මුදල වන රු.13,762,138 ක් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂයේ සිට ජංගම ගිණුම තුළ නිශ්කාර්යව පැවතුණි. | නිරීක්ෂණය පිළිගනිමි. COVID 19, ආර්ථික ව්‍යසනය, වැනි විවිධ හේතුමත ද, තාක්ෂණික බීජෞෂණාගාර මඟින් නව නිපැයුම්කරුවන්ට සේවා ලබා දීමේ දීත් විවිධ ප්‍රයෝගික ගැටළු මතුවිය. එබැවින් මෙම මුදල වඩාත් ඵලදායීව නව නිපැයුම්කරුවන්ට සේවාවක් සැපයීම සඳහා වන යෙදවීමට ක්‍රමවේදයක් සකස් කිරීමට සාකච්ඡා කරමින් පවතී. | අරමුදල් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ක්‍රියාකාරී සැලැස්මේ දත්ත පද්ධතිය කළමනාකරණය හා වෙබ් අඩවිය සංවර්ධනය සහ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යන ක්‍රියාකාරකම් 02 ක සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු. 9,000,000 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණයන් හා එකඟ වේ. 2023 වසරේ කාර්තුමය ප්‍රගති වාර්තා තුල අදාල ක්‍රියාකාරකම්හි අපේක්ෂිත ඉලක්කයන් සපුරාගැනීමට නොහැකි වූ හේතු සඳහන් කර ඇත. 2023 වසරට අනුමත වූ මුදල් නියමිත කාලයන් හි දී නොලැබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුය. |